# පරිගනක ජාලය සඳහා සේවා සැපයීම 2015 – 2016.

නුගේගොඩ, අංක 126 දරන ස්ථානයේ පිහිටි ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පරිගනක ජාලයේ නඩත්තු හා සේවා කටයුතු පවත්වාගෙන යාම සඳහා සුදුසුකම්ලත් සේවා සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

ප්‍රසම්පාදන අයදුම්පත් 2015 මාර්තු මස 16 වන දින පෙරවරු 9.00 සිට මාර්තු මස 26 වන දින පස්වරු 3.00 දක්වා ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්යාලයේ පළමු මහලේ පිහිටි පරිපාලන අංශයෙන් ලබා ගත හැකි ය.

**ප්‍රසම්පාදන අයදුම්පතක් ලබා ගැනීම සඳහා :-**

1. නැවත නො ගෙවන රුපියල් 250.00 ක ප්‍රසම්පාදන අයදුම්පත් ගාස්තුවක්,
2. ව්‍යාපාරයක් ලෙස පරිගනක ජාල සේවා සැපයීමේ සේවාවක් පවත්වාගෙන යාම සඳහා සමාගම් ආඥා පනත යටතේ ලියාපදිංචි වූ බව දැක්වෙන සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.

ප්‍රසම්පාදන අයදුම්පත් භාර ගැනීම 2015 අප්‍රේල් මස 08 වන දින පස්වරු 2.30 ට අවසන් කෙරේ. එදින ම පස්වරු 3.00 ට ප්‍රසම්පාදන කැඳවීම් පත් විවෘත කිරීමට නියමිත අතර, සැපයුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගි විය හැකි ය.

මේ පිළිබඳ වැඩිමනත් තොරතුරු කාර්යාල වේලාවන් තුළ දුරකථන අංක 0112815710 ඔස්සේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නියෝජ්‍ය ලේකම්වරයා ඇමතීමෙන් ලබාගත හැකි ය.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

**එච්. එන්. එන්. ගුණසේකර,**
ලේකම්,
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.